# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2222/13 - 2021 අප්‍රේල් මස 05 වැනි සඳුදා - 2021.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ව්‍යාප්ත වී තිබෙන කටුපොල් වගාව නිසා පාංශු ඛාදනය, ජල උල්පත් සිඳීයාම්, ජෛව විවිධත්වයට හානි පැමිණීම් හා ජන ජීවිතයට බාධා එල්ලවීම් සිදුවන බවට මා වෙත නියෝජනයන් ඉදිරිපත්වී ඇති බැවින් ද,

තව ද, පරිසරයට විය හැකි අනර්ථකාරී ප්‍රතිවිපාක නොසලකා හරිමින්, මහා පරිමාණ සමාගම් විසින් කටුපොල් වගාව දිගින් දිගටම සිදු කිරීම සම්බන්ධයෙන් ජනතාවගේ අප්‍රසාදය මහජන නියෝජිතයින් හරහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරුව, කටුපොල් වගාව තහනම් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන ඇති බව අවධානයට ලක් කරමින් ද,

තව ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(ඇ), (ඉ) සහ 27(14) ව්‍යවස්ථා මගින් දක්වා ඇති පරිදි පරිසර ආරක්ෂාව හා පොදුජන යහපත ප්‍රමුඛව රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට රජය බැඳී සිටින බව සැලකිල්ලට ගනිමින් ද,

ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ තිරසර පාරිසරික පද්ධතියක් සුරක්ෂිත කරදීම මූලික යුතුකමක් බව අවධාරණය කරමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ කටුපොල් වගාව සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතු බවට මෙයින් නියෝග කරමි.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, දැනටමත් වගාකර ඇති කටුපොල් වගාවන්, පැල තවාන් ක්‍රමානුකූලව ඉවත් කිරීම සඳහා වසරකට 10%ක පමණ කටුපොල් වගාකර ඇති ඉඩම්, රබර් හෝ වෙනත් එම ප්‍රදේශවල ජල පෝෂිත තත්ත්වයන් ආරක්ෂා වන වගාවන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නියෝග කරමි.

තව ද, මෙකී තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඊට ආනුශාංගික අනිකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ නීති හා අණපනත් ක්‍රියාත්මක කිරීමටත්, අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීමටත්, අංක 2187/27 හා 2020.08.09 දින දරන ගැසට් නිවේදනය හා ඊට අදාළ සංශෝධනයන් මගින් පවරා ඇති වගකීම් හා කාර්යභාරයන් ඉටු කිරීමට එකී අණපනත්වලින් බලය පැවරී ඇති අමාත්‍යවරුන්ට, ලේකම්වරුන්ට හා ආයතන ප්‍රධානීන්ට මෙයින් නියම කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධරයකු විසින් පෙර කී තීරණය පරිදි පවරන රාජකාරි අප්‍රමාදව ඉටු කළ යුතු බව මෙයින් නියම කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ අප්‍රේල් මස 05 වැනි දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

04 - 618

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.